# කැලණිය විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

## වාණිජ විද්‍යාවේදී ගෞරව (බාහිර) උපාධි පාඨමාලාව

# විෂය නිර්දේශය

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

**www.cdce.kln.ac.lk**

**<u>ප්‍රකාශනය</u>**

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය කැලණිය විශ්වවිද්‍යාලය

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලිඛිත අවසරයකින් තොරව උපුටා ගැනීම්, මුද්‍රණය කිරීම් සපුරා තහනම් වේ.

**විමසීම් :-**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
අංක. 56/6,
කෝන්ගහවත්ත පාර,
නුවර පාර,
කිරිබත්ගොඩ.

**දුරකථන :-**

011 2987000
011 2987001
011 2987002
011 2987005

**වෙබ් අඩවිය :-**

***www.kln.ac.lk / cdce***

# 01. උපාධිධාරී සන්දර්භය




වාණිජවේදී ගෞරව උපාධිය සමත්වන උපාධිධාරියෙකුට හැකි විය යුත්තේ:

- ව්‍යාපාර ගැටලු විසඳීම සඳහා කළමනාකරණයේ මූලික සංකල්ප සහ මූලධර්ම අදාළ කිරීම.
- සුදුසු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, වැඩසටහන්, සහ චර්යා සංග්‍රහ හඳුන්වා දෙමින් ව්‍යාපාර කළමනාකරණ ගැටලු විසඳීම.
- විවිධ ආයතනවල කළමනාකරණ භූමිකාවන්හි විවිධ පාරිසරික තත්ත්වයන්ට නම්‍යශීලී බව සහ අනුවර්තනය වීමේ හැකියාව පෙන්නුම් කිරීම.

- වෘත්තීය සහ ව්‍යාපාරික සන්දර්භය තුළ ඵලදායී සන්නිවේදන මෙවලම් සහ ශිල්පීය ක්‍රම යෙදීම.
- ආචාරධාර්මික සහ වෘත්තීය ක්‍රියාකාරික වගකීම් සහිත පුරවැසියෙකු වන අතරම අඛණ්ඩ පුද්ගල සහ වෘත්තීය සංවර්ධනයක් පෙන්නුම් කිරීම.
- ඒකියා නියුක්තියේදී අවශ්‍ය අදාළ කළමනාකරණ නිපුණතා ප්‍රදර්ශනය කිරීම.

## 02. වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLOs)

PLO1: ප්‍රධාන සංකල්ප සහ න්‍යායන් පිළිබඳ උසස් හා සමකාලීන දැනුම සහ අවබෝධය නිරූපණය කිරීම.

PLO2: දත්ත විවේචනාත්මකව විශ්ලේෂණය කිරීමට, ප්‍රතිඵල අර්ථ නිරූපණය කිරීමට සහ නව නිෂ්පාදන සඳහා සහ නව ව්‍යාපාර මොඩලයන් සඳහා නව්‍ය සහ සාධාරණීය විසඳුම් යෝජනා කිරීමට ගුණාත්මක, ප්‍රමාණාත්මක සහ තාක්ෂණික කුසලතා යෙදීම.

PLO3: ව්‍යාපාරික ගැටළු විසඳීම සහ ව්‍යාපාරික අවස්ථා සම්බන්ධයෙන් කළමනාකරණ ක්ෂේත්‍ර සහ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රවල විවිධ සහ ගෝලීය දර්ශන ඒකාබද්ධ කිරීම.

PLO4: තොරතුරු හා අදහස් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය, සමාජ චිත්තවේගීය සහ භාෂා කුසලතා භාවිතා කිරීම.

PLO5: බහුවිධ සහයෝගීතා කණ්ඩායම්වල වැඩ කිරීම, නායකත්වය ලබා දීම සහ සමාජ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.

PLO6: වෘත්තීය පරිසරයක් තුළ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සඳහා මූලිකත්වය ගැනීම, පුද්ගලික සහ කණ්ඩායම් වගකීම් ඉටු කිරීම.

PLO7: ධනාත්මක ආකල්ප සහ සමාජ වගකීම පෙන්නුම් කිරීම.

PLO8: ගෝලීය පුරවැසියෙකුට අවශ්‍ය සදාචාරාත්මක අවශ්‍යතා, සදාචාරාත්මක වගකීම් සහ වගවීම නිරූපණය කිරීම.

PLO9: ජීවිතය සඳහා දැක්ම තීරණය කර ඒ අනුව දිගුකාලීන උපාය මාර්. සකස් කිරීම.

PLO10: ජීවිතයේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය අතිරේක නිපුණතා වර්ධනය කිරීම සඳහා විද්වත් සමාලෝචන සහ ද්විතීයික තොරතුරු මූලාශ්‍ර භාවිතා කරමින් ස්වාධීන ඉගෙනීමක නිරත වීම.

## 03.උපාධිධාරී සන්ධර්භය සහ වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLOs) සමඟ ගැළපීම (Mapping of Graduate Profile and PLO)

<u>විද්වත්භාවය : ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ න්‍යායික හා සංකල්පීය දැනුම</u>

PLO1: වාණිජ, ව්‍යවසායකත්වය, ව්‍යාපාර තාක්ෂණය සහ මූල්‍ය කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන සංකල්ප සහ න්‍යායන් පිළිබඳ උසස් සමකාලීන දැනුම සහ අවබෝධය නිරූපණය කිරීම.

<u>වෘත්තීයභාවය : යෙදුමේ නිර්මාණශීලිත්වය සහ නම්‍යශීලී බව</u>

PLO2: දත්ත විවේචනාත්මකව විශ්ලේෂණය කිරීමට, ප්‍රතිඵල අර්ථ නිරූපණය කිරීමට සහ නව නිෂ්පාදන සඳහා නව්‍ය සහ සාධාරණීය විසඳුම් යෝජනා කිරීමට ගුණාත්මක, ප්‍රමාණාත්මක සහ තාක්ෂණික කුසලතා යෙදීම.

PLO3: ව්‍යාපාරික ගැටළු විසඳීම සහ ව්‍යාපාරික අවස්ථා සම්බන්ධයෙන් කළමනාකරණ ක්ෂේත්‍ර සහ ඒ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රවල විවිධ සහ ගෝලීය දර්ශන ඒකාබද්ධ කිරීම.

PLO4: තොරතුරු හා අදහස් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය, සමාජ චිත්තවේගීය සහ භාෂා කුසලතා භාවිතා කිරීම.

**සහයෝගී නායකත්වය : සාමූහික කාර්යන් සහ කැපවීම**

PLO5: බහුවිධ සහයෝගීතා කණ්ඩායම්වල වැඩ කිරීම, නායකත්වය ලබා දීම සහ සමාජ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.

PLO6: වෘත්තීය පරිසරයක් තුළ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සඳහා මූලිකත්වය ගැනීම, පුද්ගලික සහ කණ්ඩායම් වගකීම් ඉටු කිරීම.

**ගෝලීය පුරවැසිභාවය : ආකල්ප, වටිනාකම්, ආචාර ධර්ම සහ වගවීම**

PLO7: ධනාත්මක ආකල්ප සහ සමාජ වගකීම පෙන්නුම් කිරීම.

PLO8: ගෝලීය පුරවැසියෙකුට අවශ්‍ය සදාචාරාත්මක අවශ්‍යතා, සදාචාරාත්මක වගකීම් සහ වගවීම නිරූපණය කිරීම.

**අධිප්‍රජානනය : ජීවිතය සඳහා දැක්ම හා අඛණ්ඩ ඉගෙනුම**

PLO9: ජීවිතය සඳහා දැක්ම තීරණය කර ඒ අනුව දිගුකාලීන උපාය මාර්ග සකස් කිරීම.

PLO10: ජීවිතයේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය අතිරේක නිපුණතා වර්ධනය කිරීම සඳහා විද්වත් සමාලෝචන සහ ද්විතීයික තොරතුරු මූලාශ්‍ර භාවිතා කරමින් ස්වාධීන ඉගෙනීමක නිරත වීම.

## 04. පාඨමාලා ව්‍යුහය

වාණිජවේදී ගෞරව උපාධි වැඩසටහන වසර හතරක් හරහා ව්‍යුහගත කර ඇත: 1,2,3 හා 4 වශයෙන් වැඩසටහනට එක් වසරකට සම්භාර 30ක් මත පදනම්ව, මූලික සම්භාර 120ක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ.

**i. පාඨමාලා ඒකක**

පාඨමාලා ඒකකයක් විෂයයක් වන අතර, සෑම පාඨමාලා ඒකකයකටම සම්භාර වටිනාකමක් ඇත.

**ii. සම්භාර**

සම්භාර යනු ශ්‍රේණියේ ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීමේදී භාවිතා කරන කාලය මත පදනම් වූ ප්‍රමාණාත්මක මිනුමක් වේ.

**iii. මාධ්‍යය**

ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි සහ සිංහල වේ. සිසුන්ට සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගත හැකිය.

**iv. ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රමය**

මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් ස්වයං අධ්‍යයන මූලික ඉගෙනීම සඳහා නිර්මාණය කර ඇත. කෙසේ වෙතත්, අධ්‍යයන සහාය ලබා දෙනු ලබන්නේ LMS හරහාය (ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය). CDCE (දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ) සිසුන් සඳහා අමතර අධ්‍යයන ආධාරයක් ලෙස සැලකිය යුතු සම්මන්ත්‍රණ මාලාවක් සඳහා පහසුකම් සපයයි. තවද, වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් එක් පාඨමාලා ඒකකය සඳහා LMS හරහා ශිෂ්‍යයාට මාර්ගෝපදේශ සපයයි.

## 05. පාඨමාලා ව්‍යුහය

| වසර | විෂය කේතය | පාඨමාලා ඒකකයේ නම | පාඨමාලා තත්ත්වය |
|---|---|---|---|
| 1 | BCOM 18015 | කළමනාකරණ මූලධර්ම | හර |
| | BCOM 18025 | ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව | හර |
| | BCOM 18035 | මූල්‍ය ගිණුම්කරණය | හර |
| | BCOM 18045 | ව්‍යාපාර සඳහා ගණිතය | හර |
| | BCOM 18055 | ව්‍යවසායකත්වය | හර |
| | BCOM 18065 | තොරතුරු කළමනාකරණය | හර |
| | BCOM 18075* | ව්‍යාපාර සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි | හර |
| 2 | BCOM 28085 | සංවිධානාත්මක චර්යාව | හර |
| | BCOM 28095 | අලෙවි කළමනාකරණය | හර |
| | BCOM 28105 | ව්‍යාපාර සංඛ්‍යානය | හර |
| | BCOM 28115 | පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය | හර |
| | BCOM 28125 | සාර්ව ආර්ථික විද්‍යාව | හර |
| | BCOM 28135 | මානව සම්පත් කළමනාකරණය | හර |
| 3 | BCOM 38145 | ව්‍යාපාර සහ ආයතනික නීතිය | හර |
| | BCOM 38155 | මූල්‍ය කළමනාකරණය | හර |
| | BCOM 38165 | මෙහෙයුම් සහ සැපයුම් දාම කළමනාකරණය | හර |
| | BCOM 38175 | පර්යේෂණ ක්‍රමවේද | හර |
| | BCOM 38185 | බදුකරණය | හර |
| | BCOM 38195 | විගණනය සහ සහතිකකරණය | හර |
| 4 | BCOM 48205 | උපායමාර්ගික කළමනාකරණය | හර |
| | BCOM 48215 | සංවර්ධන ආර්ථික විද්‍යාව | හර |
| | BCOM 4822A** | සීමාවාසික පුහුණුව | හර |
| | BCOM 4823A** | පර්යේෂණ නිබන්ධනය | හර |

*BCOM 18075 යනු හර විෂයයක් වන අතර GPA ගණනය කිරීම සඳහා නොසැලකේ.

**BCOM 4822A සීමාවාසික පුහුණුව සහ BCOM 4823A පර්යේෂණ නිබන්ධනය - "A" මඟින් සම්භාර 10 ක් දක්වයි.

## 06. ඇගයීම

පාඨමාලා ඒකකයක් පරීක්ෂා කිරීම

- පාඨමාලා ඒකකයක් විභාගයක් මගින් ඇගයීමට ලක් කෙරේ.
- සියලුම පාඨමාලා ඒකකවල විභාග අදාළ මට්ටම් අවසානයේ පවත්වනු ලැබේ.

## 07. ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය

පාඨමාලා ඒකකයක් සම්බන්ධයෙන් ලබා ගන්නා ලකුණු පහත පරිදි වර්ග දොළහක ක්‍රමයකට අනුව ශ්‍රේණිගත කෙරේ.

| ලකුණු | ශ්‍රේණිය | ශ්‍රේණියේ ලකුණු අගය **(Grade Point Value)** |
|---|---|---|
| 85-100 | A+ | 4.00 |
| 70-84 | A | 4.00 |
| 65-69 | A- | 3.70 |
| 60-64 | B+ | 3.30 |
| 55-59 | B | 3.00 |
| 50-54 | B- | 2.70 |
| 45-49 | C+ | 2.30 |
| 40-44 | C | 2.00 |
| 35-39 | C- | 1.70 |
| 30-34 | D+ | 1.30 |
| 25-29 | D | 1.00 |
| 00-24 | E | 0.00 |

සිසුන් තමන් ලියාපදිංචි වී ඇති සියලුම පාඨමාලා ඒකක සම්පූර්ණ කළ යුතු අතර, යම් පාඨමාලා ඒකකයක් සම්පූර්ණ නොකිරීමට වලංගු හේතු ඉදිරිපත් කිරීමට අසමත් වුවහොත්, 'E' ශ්‍රේණියක් සේ සලකනු ලැබේ.

## 08. ශ්‍රේණියේ ලක්ෂ්‍ය සාමාන්‍යය (Grade Point Average)

ශ්‍රේණියේ ලක්ෂ්‍ය සාමාන්‍යය (GPA) යනු ශ්‍රේණියේ ලක්ෂ්‍ය අගයන්හි සම්භාර බරිත අංක ගණිත මධ්‍යයනයයි: උ.දා. GPA තීරණය කරනු ලබන්නේ මුළු සම්භාර බරිත ශ්‍රේණියේ ලක්ෂ්‍ය අගය මුළු සම්භාර ගණනින් බෙදීමෙනි.

GPA දෙවන දශම ස්ථානයට ගණනය කළ යුතුය.

උදාහරණයක් වශයෙන්, A, C, B+, D, C+ සහ B, A+ යන ශ්‍රේණි සහිත සම්භාර හතර බැගින් පාඨමාලා ඒකක පහක් සහ පාඨමාලා ඒකක දෙක බැගින් සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයෙකුට GPA පහත පරිදි හිමි වේ.

$$= \frac{4 \times 4.0 + 4 \times 2.0 + 4 \times 3.3 + 4 \times 1.0 + 4 \times 2.3 + 2 \times 3.0 + 2 \times 4.0}{4 + 4 + 4 + 4 + 4 + 2 + 2} =$$

$$= \frac{16.0 + 8.0 + 13.2 + 4.0 + 9.2 + 6.0 + 8.0}{24.0} =$$

$$= \frac{64.4}{24.0} = \quad = 2.683 = \underline{\underline{2.68}}$$

## 09. පාඨමාලා අන්තර්ගතය

**පාඨමාලා කේතය** : BCOM 18015

**පාඨමාලා නාමය** : කළමනාකරණ මූලධර්ම

**පාඨමාලා අරමුණ** :

කළමනාකරණ මූලධර්ම, කළමනාකරණ කාර්යන් සහ කළමනාකරුවන්ගේ කාර්යභාරය සහ තීරණ පිළිබඳ දැනුම ලබා දීම අරමුණු කරයි. වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය සහ කළමනාකරණය පිළිබඳ වෘත්තිකයන්ට වාණිජවේදී උපාධියේ බහුවිධ අවධානය ග්‍රහණය කර ගැනීම සඳහා මෙම පාඨමාලාවේ වර්ධනය කරන දැනුම සහ කුසලතා අත්‍යවශ්‍ය වේ.

### අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- කළමනාකරණය නිර්වචනය කර නූතන කළමනාකරුවන් සඳහා එහි අදාළත්වය පැහැදිලි කිරීම.

- කළමනාකරුවෙකුගේ කාර්ය සාධනය වැඩි දියුණු කරන කළමනාකරණ කුසලතා, භූමිකාවන් සහ විලාස පැහැදිලි කිරීම.

- කළමනාකරණ මූලධර්ම සහ කාර්යයන් පැහැදිලි කිරීම.

- ආයතනවල කළමනාකරණ මූලධර්ම සහ කාර්යන් පිළිබඳ භාවිතය සමාලෝචනය කිරීම.

- සමාජ වගකීම්වල වැදගත්කම සහ සංවිධාන තුළ එහි යෙදීම් සාකච්ඡා කිරීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

කළමනාකරණය පිළිබඳ හැඳින්වීම, කළමනාකරණයේ පරිණාමය, ආයතනික සංස්කෘතිය සහ පරිසරය, තීරණ ගැනීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, වෙනස සහ නවෝත්පාදනය කළමනාකරණය කිරීම, නායකත්වය, අභිප්‍රේරණය, සන්නිවේදනය, පාලනය, සමාජ වගකීම සහ කළමනාකරණ ආචාර ධර්ම

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්: LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රම:**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**

1. Robbins, S.P. & Coulter, M. (2021). *Management*. (15th ed.). Pearson Education.
2. Griffin, R.W. (2021). *Management*. (13th ed.). Cengage Learning, South-Western.
3. Jones, G. & George, J. (2021). *Essentials of Contemporary Management*. (9th ed.). McGraw Hill Education.
4. Daft, R. L. (2018). *New Era of Management.* (13th ed.). Cengage Learning, South- Western

**පාඨමාලා කේතය** : BCOM 18025

**පාඨමාලා නාමය** : ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව

**පාඨමාලා අරමුණ** :

මෙම පාඨමාලා මොඩියුලය සැලසුම් කර ඇත්තේ ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප සහ න්‍යායන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීමට සහ සිසුන්ට තනි තීරණ ගැනීමේ ඒකකවල ආර්ථික හැසිරීම තේරුම් ගැනීමට, යෙදීමට සහ විශ්ලේෂණය කිරීමට න්‍යායික පදනමක් ලබා දීම සඳහා ය. මෙම පාඨමාලාව හිඟකම සහ තේරීම යන සංකල්පය ; ඉල්ලුම-සැපයුම විශ්ලේෂණය; පාරිභෝගික හැසිරීම් පිළිබඳ න්‍යාය; නිෂ්පාදන පිරිවැය පිළිබඳ න්‍යාය; සහ ආයතනික න්‍යාය (පූර්ණ තරඟය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරය) පිළිබඳ පරීක්ෂා කරයි.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- හිඟකම පිළිබඳ ගැටලුව සමඟ කටයුතු කිරීමේදී ආර්ථික විද්‍යාවේ ස්වභාවය විස්තර කිරීම.
- වෙළෙඳපොළ මත ආර්ථික සිදුවීම්වල බලපෑම පරීක්ෂා කිරීම සඳහා සැපයුම සහ ඉල්ලුම විශ්ලේෂණය සිදු කිරීම.
- නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම අනුව පාරිභෝගිකයින්ගේ හැසිරීම විශ්ලේෂණය කිරීම.
- නිෂ්පාදනය සහ පිරිවැය වැනි ආයතනයක හැසිරීම්වලට බලපාන සාධක ඇගයීම.
- විවිධ වෙළෙඳපොළ ව්‍යුහයන් යටතේ ආයතනවල කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම.

- වෙළෙඳපොළ අසාර්තකත්වය සහ එම අසාර්කත්වයන් සමඟ කටයුතු කිරීමේදී රජයේ කාර්ය භාරය හඳුනා ගැනීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

ආර්ථික විද්‍යාව පිළිබඳ හැඳින්වීම, ඉල්ලුම සහ සැපයුම, පාරිභෝගික හැසිරීම් න්‍යාය, නිෂ්පාදන න්‍යාය, නිෂ්පාදන පිරිවැය පිළිබඳ න්‍යාය, ආයතනික න්‍යාය

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්ඃ LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රමඃ**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**

1. Salvatore D. (2008), *Microeconomics Theory and Applications*, (5th ed.). Oxford University Press.
2. Crystal K.A., and Lipsey R.G. (1997), *Economics for Business and Management*, Oxford University Press.
3. Dwivedi D.N. (2017), *Microeconomics Theory and Applications*, (3rd ed.). Person education.
4. Pindyck R.S., and Rubinfeld D.L., (2018), *Microeconomics*, (9th ed.). Global Edition, Pearson Education.
5. Salvatore D., (2011), *Schaum's Outline of Microeconomics*, (4th ed.). Tata, McGraw Hill.

**පාඨමාලා කේතය** : BCOM 18035

**පාඨමාලා නාමය** : මූල්‍ය ගිණුම්කරණය

**පාඨමාලා අරමුණ** :

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන ගිණුම්කරණ පරිසරය පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සහ එම ප්‍රමිතීන් ව්‍යාපාරික ආයතනවලට අදාළ වන ආකාරය නිරීක්ෂණය කිරීම, හවුල්කාරිත්වය ඒකාබද්ධ කිරීම සහ හවුල්කාරිත්වය සමාගමක් බවට පරිවර්තනය කිරීම සහ අසම්පූර්ණ වාර්තා පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් වර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා ගිණුම්කරණ පරිසරය සහ සංකල්පීය රාමුව විස්තර කිරීම.
- අසම්පූර්ණ වාර්තා තුළින් අවසාන ගිණුම් සැකසීම සඳහා ගිණුම්කරණ ක්‍රියා පටිපාටිය යෙදීම.
- නව හවුල් ව්‍යාපාරයක් ඇති කිරීම සඳහා තනි පුද්ගල ව්‍යාපාර එකක් හෝ කිහිපයක් සහ හවුල් ව්‍යාපාර එකක් හෝ කිහිපයක් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ගිණුම් සකස් කිරීම.
- හවුල් ව්‍යාපාරයක් සමාගමකට පරිවර්තනය කිරීමට අවශ්‍යය ගිණුම් සකස් කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිතීන්හි අරමුණ පැහැදිලි කිරීම.
- ගිණුම්කරණ ප්‍රමිතීන්හි පැහැදිලි කර ඇති ගිණුම්කරණ පිළියම් යෙදීම.

- ගිණුම්කරණ ප්‍රමිතීන් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හඳුනා ගැනීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

ගිණුම්කරණ පරිසරය සහ සංකල්පීය රාමුව, අසම්පූර්ණ වාර්තා, හවුල් ව්‍යාපාරවල, හිමිකාර වෙනස්කම්වල බලපෑම, හවුල් ව්‍යාපාර ඒකාබද්ධ කිරීම, හවුල් ව්‍යාපාරයෙන් සමාගමක් බවට පරිවර්තනය කිරීම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, තොග, දේපල, පිරියත සහ උපකරණ, බදු දීම , සාධාරණ අගය මැනීම, ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම ගණනය)

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්: LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රම:**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**


1. Maheshwari, S. N., & Maheshwari, S. K. (2018). *Advanced Accountancy* (11th ed., Vol 01), Vikas Publishing, India.
2. Shukla, M. C., Grewal, T. S., & Gupta, S.C. (2017). *Advanced Accounts* (19th ed., Vol. 01). S. Chand & Company Ltd. India.
3. Wood, F., & Sangster, A. (2018). *Business Accounting Volume 1* (14th ed.). Pitman Publishing.

4. Sri Lanka Accounting Standards (2019), Institute of Chartered Accountants of Sri Lanka, Sri Lanka.
5. Sri Lanka Accounting Standards for Small & Medium Sized Entities (SLFRS for SME's (2019), Institute of Chartered Accountants of Sri Lanka, Sri Lanka.

**පාඨමාලා කේතය** : BCOM 18045

**පාඨමාලා නාමය** : ව්‍යාපාර සඳහා ගණිතය

**පාඨමාලා අරමුණ** :

ආර්ථික විද්‍යාව, මූල්‍ය සහ ආයෝජන ඇතුළු පුළුල් ව්‍යාපාර ක්ෂේත්‍රයන් තුළ ඇති ගණිතමය ගැටලු අවබෝධ කර ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ විසඳීමට අවශ්‍ය මූලික ගණිත කුසලතා සැපයීම සඳහා පාඨමාලා ඒකකය සැලසුම් කර ඇත.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- ගණිතය ඉගෙන ගැනීමට ඇති ඔවුන්ගේ හැකියාවන් පිළිබඳ විශ්වාසය වැඩි කිරීම මත පදනම්ව වඩාත් ධනාත්මක ආකල්ප ලබා ගැනීම.

- ඔවුන්ට උනන්දුවක් දක්වන හෝ ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රවල ප්‍රයෝජනවත් ගැටළු විසඳීමට ගණිතය භාවිතා කිරීමේ හැකියාව වැඩි කිරීම.

- ගණිතමය සංකල්ප සන්නිවේදනය කිරීමට, තර්කනය ප්‍රදර්ශනය කිරීමට සහ ගැටළු විසඳීමට ගණිතමය භාෂාව, සංකේත සහ අංකනය භාවිතා කිරීම.

- ප්‍රමාණාත්මක ගැටළු විසඳා ප්‍රමාණාත්මක විමර්ශන සිදු කරන අතර එහිදී ඔවුන් අදහස් සොයා ගන්නා අතර ප්‍රශ්න කිරීමේ සහ විසඳුම් ගොඩනැගීමේ කුසලතා වර්ධනය කරන තීක්ෂණ බුද්ධිය ලබා ගැනීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

ගණිතයේ මූලික සංකල්ප, ප්‍රකාශක / දර්ශක, සාධකකරණය, කට්ටල සහ ඒවායේ යෙදුම්, සමීකරණ, ලඝුගණක, අංක ගණිත ශ්‍රේණි, ජ්‍යාමිතික ශ්‍රේණි, ගණනය සහ එහි යෙදුම්, න්‍යාස, වීජ ගණිතය, ප්‍රමිති සහ සංයෝජන, ද්විපද ප්‍රමේයය, ගණිතය, මූල්‍ය ආචාර විද්‍යාව

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්: LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රම:**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**


1. Gary Bronson, Richard Bronson, Maureen Kieff (2021*)* *Mathematics for Business.* (7th ed.). Mercury Learning and Information.
2. O’Regan, G. (2022). *A Guide to Business Mathematics*. CRC Press.

3. Lipschutz, S., (2013) *Schaum's Outline* of *Discrete Mathematics*.(3rd ed. revised). — New Delhi: Tata McGraw Hill Education (India) Private Limited
4. Rosen, Kenneth H, (2013) *Discrete Mathematics and Its' applications with combinatorics and graph theory*. (7th ed.). McGraw Hill Education (India) Private Limited.

**පාඨමාලා කේතය** : BCOM 18055

**පාඨමාලා නාමය** : ව්‍යවසායකත්වය

**පාඨමාලා අරමුණ** :

ව්‍යවසායකත්ව ව්‍යාපාරයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යවසායකත්වයේ අභියෝග සහ වාසි සමාලෝචනය කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සිසුන්ට ලබා දීම සඳහා මෙම පාඨමාලාව සැලසුම් කර ඇත. ව්‍යවසායකත්වය ඔවුන්ගේ ජීවිතවල කාර්යභාරයක් ඉටු කරන්නේ කෙසේද යන්න තීරණය කිරීමට සිසුන් තමන් පිළිබඳ, ඔවුන්ගේ තීරණ සහ ඔවුන්ගේ ඉලක්ක පිළිබඳ ඉගෙන ගනු ඇත. මෙම පාඨමාලාවේ වර්ධනය කරගත් දැනුම සහ කුසලතා ඔවුන්ගේ උපාධියෙන් පසු ආරම්භක ව්‍යාපාර සඳහා අත්‍යවශ්‍ය වේ.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- ව්‍යවසායකත්වය පිළිබඳ සංකල්පය සහ එහි වැදගත්කම විස්තර කිරීම.

- වෙළඳපල අවස්ථා සඳහා නව සහ අද්විතීය ප්‍රවේශයන් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන මානසිකත්වයක් ගොඩ ගැනීම.

- ව්‍යවසායක ක්‍රියාවලිය පැහැදිලි කිරීම.
- නව්‍ය ව්‍යාපාරික අදහස් සහ වෙළඳපල අවස්ථා හඳුනා ගැනීම.
- ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම.
- තිරසාර සහ ශක්‍ය ව්‍යාපාරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය මෙවලම් හඳුනා ගැනීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

ව්‍යවසායකයෙකු වීමට තීරණය කිරීම, අවස්ථා හඳුනා ගැනීම සහ අදහස් ජනනය කිරීම, කර්මාන්ත සහ තරඟකරුවන්ගේ විශ්ලේෂණය, ශක්‍යතා විශ්ලේෂණය, ව්‍යාපාර සැලැස්මක් ලිවීම, නව ව්‍යාපාර නවෝත්පාදනය සඳහා මූල්‍යකරණය, නව ව්‍යාපාර සඳහා නීතිමය අංශය, ව්‍යාපාර ආකෘතිය සංවර්ධනය කිරීම.

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්: LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රම:**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**


1. Barringer, R.B., Ireland, D.R. (2019). *Entrepreneurship: Successfully Launching New Ventures*, (6th ed.). Pearson Education.
2. Hisrich, R., Peters, M., and Shephered, D. (2023). *Entrepreneurship*. (12th ed.). Mcgraw Hill Inc.
3. Allen, K.R. (2019). *Launching New Ventures: An Entrepreneurial Approach*, (8th ed.). Cengage Learning.


**පාඨමාලා කේතය** : BCOM 18065

**පාඨමාලා නාමය** : කළමනාකරණ තොරතුරු පද්ධති

**පාඨමාලා අරමුණ** :

මෙම පාඨමාලා මොඩියුලය සැලසුම් කර ඇත්තේ ආයතනවල කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳව සිසුන්ට අතරමැදි මට්ටමේ දැනුමක් ලබා දීම සඳහා ය.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- කළමනාකරණ තොරතුරු පද්ධති යනු කුමක්ද සහ වර්තමාන සංවිධාන තුළ එහි කාර්යභාරය විස්තර කිරීම.
- ව්‍යාපාරයක එක් එක් තොරතුරු පද්ධතිවල කාර්යභාරය ඇගයීම.
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පැහැදිලි කිරීම.
- තොරතුරු පද්ධති සමඟ සංවිධානයක් නැවත සැලසුම් කිරීම ගැන සාකච්ඡා කිරීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

තොරතුරු පද්ධති සහ එහි වැදගත්කම හැඳින්වීම ව්‍යාපාර ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති, තොරතුරු පද්ධති සහ ආයතනික උපාය මාර්ග තොරතුරු පද්ධතිවල සදාචාරාත්මක සහ සමාජීය ගැටළු, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, තොරතුරු පද්ධතිවල ආරක්ෂාව, දත්ත සමුදායන් සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ හැඳින්වීම.

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්ඃ LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රමඃ**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**

Laudon K.C. and Laudon J.P. (2021). *Management Information Systems: Managing the Digital Firm*. (17th ed.) Pearson Education.

**Course Code** BCOM 18075

**Course Title** English for Business Communication

**Course Aim**

The aim of the course is to provide fundamental knowledge pertaining to the English for business communication which the students will individually focus as they progress. The knowledge and skills developed in this course are essential and necessary for professionals in the field of commerce, business studies and management and to grasp the multidisciplinary focus of the Bachelor of Commerce degree in turning it to practical application.

**Intended Learning Outcomes**

At the end of the course unit, the students should be able to:

- Initiate conversations: greeting, introduction, small talk, farewell, give and ask for directions.
- Handle telephone conversations in English: initiate calls, answer calls, ask/give, information on the phone.
- Use markers of politeness appropriately.
- Listen to lectures and take down lecture notes in English.
- Make effective presentations and do references in English.
- Use the vocabulary related to the world of business.
- Provide summaries of written and spoken material.

- Discuss subject-related material in English.
- Identify and avoid common errors in grammar.
- Write formal letters on given contexts

**Content (Main topics)**

Greetings, Small Talk, Introductions, and Farewells, Giving Instructions and Directions, Writing Letters, Referencing Skills, Telephone Conversations, English Pronunciation, Writing Summaries, Presentations in English

**Teaching Learning methods**

Online or offline (recorded) lecture

Seminars

Independent- learning: Course materials, readings, and videos on LMS

**Assessment methods**

Continuous assessments

Final Assessment

**Recommended Reading**

Laudon K.C. & Laudon J.P., *Management Information Systems: Managing the Digital Firm.* (17th ed.). Pearson Higher Education

**පාඨමාලා කේතය** : BCOM 28085

**පාඨමාලා නාමය** : සංවිධානාත්මක චර්යාව

**පාඨමාලා අරමුණ** :

මෙම පාඨමාලාව සංවිධානයේ මානව හැසිරීම් පිළිබඳ සිසුන්ගේ අවබෝධය වැඩිදියුණු කිරීම සහ ආයතනික කාර්ය සාධනය වැඩි කිරීම සඳහා වඩාත් ඵලදායි ලෙස ළඟා කර ගැනීමට මිනිසුන් මෙහෙයවීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කරයි.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- ආයතනික හැසිරීම් අධ්‍යයනය කිරීම, රැකියා ස්ථානයේ සිටින පුද්ගලයින්ගේ කාර්ය සාධනය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීමට උපකාරී වන ආකාරය පැහැදිලි කිරීම.

- පුද්ගලයන්ගේ සහ සංවිධානවල සඵලතාවය වෙනස් කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ආයතනික හැසිරීම් පිළිබඳ න්‍යායන් සහ සංකල්ප භාවිතා කළ හැකි ආකාරය විස්තර කිරීම.

- සංජානන, ගැටළු විසඳීම, තීරණ ගැනීම, ඵලදායී සන්නිවේදනය, ඵලදායී ස්වයං කළමනාකරණය, ස්වයං දැනුවත්භාවය, විශ්ලේෂණ කුසලතා සහ අන්තර් පුද්ගල කුසලතා වර්ධනය කිරීම.

**අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)**

සංවිධාන චර්යාවන් හැඳින්වීම, ආයතනවල පුද්ගල හැසිරීම, සංජානනය, ආකල්ප, පෞරුෂය, අභිප්‍රේරණය, කණ්ඩායම් සහ කණ්ඩායම්, බලය සහ සංවිධාන දේශපාලනය, ගැටුම් සහ ගැටුම් කළමනාකරණය, ආතතිය සහ ආතතිය කළමනාකරණය, සංවිධානවල සන්නිවේදනය, ආයතනික සංස්කෘතිය සහ සංවිධාන වෙනස්වීම සහ සංවර්ධනය

**ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම**

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්ඃ LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රමඃ**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**


1. Robbins, S.P., & Judge, T.A. (2022). *Organizational Behavior*. (19th ed.). Pearson Education.
2. Luthans, F., Luthans, B. C., Luthans, K. W. (2021). *Organizational Behavior: An Evidence-based Approach*. (14th ed.). Information Age Publishing.
3. Hersey, P.H., Blanchard, K.H., & Johnson, D.E. (2012). *Management of Organizational Behavior: Leading Human Resources*. (10th ed.). Pearson Education.

**පාඨමාලා කේතය** : BCOM 28095

**පාඨමාලා නාමය** : අලෙවි කළමනාකරණය

**පාඨමාලා අරමුණ** :

අලෙවිකරණ කළමනාකරණයː මූලික අලෙවිකරණ සංකල්ප, සංවිධානය තුළ අලෙවිකරණයේ කාර්යභාරය සහ සමාජයේ අලෙවිකරණයේ භූමිකාව සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලන ප්‍රතිචාරාත්මක අලෙවිකරණ උපාය මාර්. සංවර්ධනය කිරීමට ඉගෙනීම අවධාරණය කරමින් අලෙවිකරණයේ ගැටළු හඳුන්වා දීම අලෙවි කළමනාකරණය අරමුණු කරයි.

**අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල**

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේː

- අලෙවිකරණය, එහි මූලික සංකල්ප සහ අලෙවිකරණයේ වැදගත්කම නිර්වචනය කිරීම.
- පාරිභෝගිකයින් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම ගැන සාකච්ඡා කිරීම.
- පාරිභෝගික වෙළඳපල සහ ව්‍යාපාරික වෙළඳපල සැසඳීම.
- ව්‍යාපාරවල විවිධ වර්ගයේ නිෂ්පාදන කොටස් කිරීම, ඉලක්ක කිරීම සහ ස්ථානගත කිරීම විශ්ලේෂණය කිරීම.
- ආයතන විසින් යොදන ලද අලෙවිකරණ මිශ්‍රණය සමාලෝචනය කිරීම.
- සමකාලීන අලෙවිකරණ උපාය මාර්ග සහ ගැටළු හඳුනා ගැනීම.

### අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)

අලෙවිකරණ කළමනාකරණය, පිළිබඳ දළ විශ්ලේෂණය, උපාය මාර්ගික සැලසුම්කරණය, නිර්මාණ පාරිභෝගික වටිනාකම, අලෙවි පරිසරය, අලෙවිකරණ තොරතුරු පද්ධතිය, අලෙවි පර්යේෂණ, පාරිභෝගික වෙළඳපල විශ්ලේෂණය, ව්‍යාපාර වෙළඳපල විශ්ලේෂණය, වෙළඳපල ඛණ්ඩනය, ඉලක්ක කිරීම සහ ස්ථානගත කිරීම, අලෙවිකරණ මිශ්‍රණය, ඩිජිටල් අලෙවිකරණය සහ සමකාලීන අලෙවිකරණ ගැටළු පිළිබඳ දළ විශ්ලේෂණය

### ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම

මාර්ගගත හෝ මාර්ගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්ः LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

### ඇගයීම් තක්සේරු ක්‍රමः

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

### නිර්දේශිත කියවීම්

1. Kotler, P. & Keller, K.L. (2021). *Marketing Management*. (16th ed.). Pearson Education.
2. Kotler, P & Armstrong, G. (2020). *Principles of Marketing*. (18th ed.). Pearson Education.
3. Kotler, P., Keller, K.L., Ang. S.H., Tan, C.T. Leong, S.M. (2017). *Marketing Management: An Asian Perspective*. (7th ed.). Pearson Education.
4. Chaffey, D. & Ellis-Chadwick. F. (2022). *Digital Marketing*. (8th ed.). Pearson Education.

**පාඨමාලා කේතය** : BCOM 28105

**පාඨමාලා නාමය** : ව්‍යාපාර සංඛ්‍යානය

**පාඨමාලා අරමුණ** :

මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වන්නේ තීරණ ගැනීම පහසු කිරීම සඳහා මූලික සංඛ්‍යාන සංකල්ප සිසුන්ට හුරු කරවීමයි.

### අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- ඒකීය, ද්විචලාංශ සහ බහුවිචලාංශ මිනුම්, නියැදීම, විශ්වාස අන්තර ඇස්තමේන්තු කිරීම, උපකල්පන පරීක්ෂා කිරීම සහ සරල රේඛීය ප්‍රතිගාමීත්වය පිළිබඳ සංකල්ප පැහැදිලි කිරීම.

- ව්‍යාපාර දත්ත විශ්ලේෂණය කිරීමට සහ අර්ථ නිරූපණය කිරීමට සංඛ්‍යානමය ක්‍රම යෙදීම

- ව්‍යාපාර දත්ත විශ්ලේෂණය කිරීමට සංඛ්‍යානමය මෘදුකාංග භාවිතා කිරීම.

### අන්තර්ගතය (ප්‍රධාන මාතෘකා)

සංඛ්‍යානය හැඳින්වීම, දත්ත විස්තර කිරීම, දත්ත විස්තර කිරීම: ස්ථානය මැනීම, දත්ත විස්තර කිරීම: විසර්ජන මිනුම්, සම්භාවිතාව සහ සම්භාවිතා බෙදා හැරීම්, නියැදීමේ ක්‍රම සහ සාමාන්‍ය ව්‍යාප්තියෙන් නියැදීම, සංඛ්‍යානමය ඇස්තමේන්තු කිරීම, ව්‍යාපාර කල්පිතය පරීක්ෂා කිරීම, බහු ප්‍රතිගාමීත්වය සහ සහසම්බන්ධය, කාල ශ්‍රේණි සහ පුරෝකථනය

### ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රම

මාර්ගගත හෝ මාර්ගගත නොවන (පටිගතකළ) දේශන

සම්මන්ත්‍රණ

ස්ව ඉගෙනුම්: LMS මත පාඨමාලා සටහන්, කියවීම් සහ වීඩියෝ

**ඇගයීම් තක්සේරු ක්‍රම:**

අඛණ්ඩ ඇගයීම්

අවසාන ඇගයීම්

**නිර්දේශිත කියවීම්**


1. Levine, D. M., Szabat, K., and Stephan, D. (2020), *Business Statistics: A first course*, (8th ed.). Pearson Education.
2. Anderson, D.R., Sweeney, D.J and Williams, T.A., Camm, J.D. and Cochran, J.J., Fry, M.J & Ohlmann, J.W. (2015), *Quantitative Methods for Business*, (13th ed). Cengage Learning.
3. Levine, D. M., Stephan, D. F., & Szabat, K. A. (2021), *Statistics for Managers Using Microsoft Excel*, (9th ed.) Pearson Education.


| | | |
|---|---|---|
| **පාඨමාලා කේතය** | : | BCOM 28115 |
| **පාඨමාලා නාමය** | : | පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය |
| **පාඨමාලා අරමුණ** | : | |

කළමනාකරණ ගිණුම්කරණ මූලධර්ම සහ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම සහ කුසලතා සැපයීම, ප්‍රායෝගික ගැටළු විසඳීමේ අවස්ථාවන්හිදී එම ශිල්පීය ක්‍රම භාවිතා කිරීම මෙම පාඨමාලාවේ අරමුණ වන අතර මෙම පාඨමාලාවේ වර්ධනය කර ඇති දැනුම සහ කුසලතා ගිණුම්කරණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා අත්‍යවශ්‍ය වන අතර ව්‍යාපාරික උපාධිධාරීන් සඳහා අවශ්‍ය වේ.

## අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල

පාඨමාලා ඒකකය අවසානයේ සිසුන්ට හැකි විය යුත්තේ:

- සංවිධානයක් තුළ විවිධ පිරිවැය සංකල්ප සහ පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ කාර්යභාරය විස්තර කිරීම.
- පිරිවැය හැසිරෙන ආකාරය විවේචනාත්මකව ඇගයීම සහ තීරණ සන්දර්භ පරාසයක මෙම තොරතුරු භාවිතා කිරීම.
- විවිධ නිශ්චිත ඇනවුම් සහ ක්‍රියාවලි පිරිවැය ක්‍රම හඳුනාගෙන අදාළ කිරීම.
- විවිධ අයවැය පද්ධතිවල විශේෂාංග සාකච්ඡා කිරීම සහ සුදුසු අයවැය සැකසීමට සහ අයවැය විචල්‍යතා විශ්ලේෂණය කිරීමට සහ අයවැයකරණය සහ සම්මත පිරිවැය වෙන්කර හඳුනා ගැනීම.
- ප්‍රමිත; සැකසුම් සහ විචල්‍යතා ගණනය කිරීම් වලින් ප්‍රමිත පිරිවැයකරණය විස්තර කිරීම.
